වලපනේ ප්‍රාදේශීය සභාව
නුවරඑළිය දිස්ත්‍රික්කය
------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 21 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජුනි 19 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට වලපනේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
--------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | මූල්‍ය ප්‍රකාශන තුළ යන්ත්‍ර හා උපකරණ උපලේඛනයේ රු.2,088,896 ක් වටිනා කාර්යාල උපකරණ අයිතම 49 ක් ඇතුළත් කර තිබුණු අතර, කාර්යාල උපකරණ උපලේඛනයේ රු.641,222 ක් වටිනා යන්ත්‍ර උපකරණ අයිතම 12 ක් ඇතුළත් කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ii) | සමාලෝචිත වර්ෂයේදී මිලදීගෙන තිබුණු රු.437,585 ක් වටිනා තිර රෙදිවල වටිනාකම ප්‍රාග්ධනිත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| (iii) | සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබූ ඉදිකිරීම් අත්තිකාරම් පියවීම සඳහා බිල්පත් 2019 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබුණ ද, එම වටිනාකම් වියදමක් ලෙස ගිණුම්ගත කර නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම රු.1,675,275 ක් අඩුවෙන් හා නොපියවූ අත්තිකාරම් ශේෂය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (iv) | මූල්‍ය ප්‍රකාශනවල 2019 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වැටුප් ලෙස දක්වා ඇති රු.101,272 ක ශේෂය පොදු සැපයුම් ණයහිමි ශේෂය තුළ ද දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (v) | 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු කඩ කාමර කුලී රු.92,988 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (vi) | 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු වැසිකිළි බදු මුදල් රු.65,000 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (vii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කලින් ලද ආදායම රු.135,087 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

(ආ) නොසැසඳූ පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ලැබිය යුතු වෙනත් ආදායම් ගිණුමේ ශේෂය රු.5,685,247 ක් වුවද උපලේඛන අනුව එම ශේෂය රු.5,765,249 ක් වූයෙන් රු.80,002 ක වෙනසක් විය. | වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 03 ක වටිනාකම රු.19,203,072 ක් වූ අතර ඉන් රු.2,286,515 ක් වසරක කාලයක් ඉක්මවා තිබුණි. | ලැබිය යුතු ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක වටිනාකම රු.19,234,108 ක් වූ අතර, ඉන් රු.7,623,695 ක් වසරක කාලයක් ඉක්මවා තිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා ඇති ටෙන්ඩර් තැන්පතු ශේෂය වූ රු.1,531,848 න් රු.1,131,848 ක ශේෂයක් සඳහා උපලේඛන ඉදිරිපත් නොකෙරුණි. | උපලේඛන යාවත්කාලීන කිරීම. | අදහස් දක්වා නොමැත. |

1.4 අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| | (i) අංක 126 (III) උපවගන්තිය | සභා බල ප්‍රදේශයේ විවිධ ස්ථානවල දුරකථන සම්ප්‍රේෂණ කුළුණු ස්ථාපිත කර තිබුණ ද අතුරු ව්‍යවස්ථා පනවා ඉන් ආදායම් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ නීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| | (ii) 219 වගන්තිය | වලපනේ පොදු වෙළඳපල කඩ කාමර අංක 62/2 සභාවේ සභිකයෙකුට බදු දී තිබුණි. | ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | අදාළ රීති ප්‍රකාරව සමික්ෂණ සිදුකළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,674,486 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 2,776,520 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,653,000 | 2,655,527 | 1,745,002 | 1,964,781 | 2,004,754 | 2,024,849 | 1,423,662 | 1,688,108 |
| කුලී | 7,411,000 | 7,891,932 | 5,790,812 | 5,315,732 | 5,896,410 | 4,949,690 | 4,424,978 | 3,487,067 |
| බලපත්‍ර ගාස්තු | 3,857,000 | 3,630,163 | 3,630,163 | - | 3,615,000 | 3,487,058 | 3,487,058 | - |
| වෙනත් ආදායම් | 7,055,000 | 6,692,433 | 438,646 | 5,669,687 | 7,197,639 | 5,279,508 | 5,235,658 | 224,895 |
| | 20,976,000 | 20,870,055 | 11,604,623 | 12,950,200 | 18,713,803 | 15,741,105 | 14,571,356 | 5,400,070 |

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු කඩ කාමර බදුගෙන තිබුණු බදුකරුවන් 06 දෙනෙකු මාස 12 සිට මාස 71 දක්වා කාල පරාසයක සිට කුලී ගෙවීම පැහැර හැර තිබුණ ද එම හිඟ අයකරගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර 2019 දෙසැම්බර් 31 දිනට හිඟය රු.1,070,360 ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| උසාවි දඩ රු.334,718 ක් හා ඉඩම් හුවමාරු කිරීමේ මුද්දර ගාස්තු රු.5,825,737 ක් අයවිය යුතුව තිබුණි. | අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

2.2.4 අධිහාර

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව ම විසින් ඉකුත් වර්ෂයන් තුළ පැනවූ අධිහාරවලින් 2019 දෙසැම්බර් 31 දිනට රු.29,975 ක මුදලක් අයකර ගැනීමට තිබුණි. | මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කාර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පිළිබඳව ප්‍රාදේශීය සභාව ප්‍රමාණවත්ව දැනුවත්වී නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුළදී ඒ සම්බන්ධයෙන් නිශ්චිත කාර්යයන් ඉටුකර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ඒ අනුව සැලසුම් සකස් කිරීම. | අදහස් දක්වා නොමැත. |

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දඹේකැලේ කසළ කළමනාකරණ මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම සඳහා 2018 ජනවාරි 09 දින රු.14,948,080 ක් වටිනාකමැති ගිවිසුමකට එළඹ තිබුණු අතර 2019 අගෝස්තු 27 දින වනවිට ද අදාළ කාර්යයන් නිමකර නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වලපනේ පොදු වෙළඳපළ කඩ කාමර 16 ට අදාළ තක්සේරුව නියමිත දින සිට ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් 2019 සැප්තැම්බර් 01 දින සිට දෙසැම්බර් 31 දක්වා කාලයට සහා අරමුදලට රු.78,750 ක ආදායමක් අහිමිව තිබුණි. | තක්සේරු කඩ කුලිය අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය අනුව විෂයයන් 5 ක ඇස්තමේන්තුව ඉක්මවූ වියදම් සඳහා ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති 14 අනුව පරිපූරක වියදම් ඇස්තමේන්තු අනුමත කරගැනීමට කටයුතු කර නොතිබුණි. | ඇස්තමේන්තුගත වියදම් ඉක්මවීමේදී ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති අනුව පරිපූරක වියදම් ඇස්තමේන්තු අනුමත කරගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති 193 අනුව අයවැයගත මූල්‍ය ප්‍රතිපාදන සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සිදුවී තිබෙන වෙනස්වීම් පිළිබඳව කරුණු පැහැදිලි කිරීමේ ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය හා පරිපාලන රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |